# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2335/07 – 2023 ජුනි 06 වැනි අඟහරුවාදා – 2023.06.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2020/255.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2022.11.21 දිනැති හා අංක 2307/07 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2022.11.14 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් හපුගල, බටුවන්තුඩාව පාර, යුනිවර්සල් සිටි, අංක 77 හි පදිංචි එම්. ජී. උජිතා රසාංගනී ඇතුළු සේවකයින් තිදෙනා සහ ගාල්ල, පහළ ඩික්සන් පාර, අංක 19 හි පිහිටි දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.04.17 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 මැයි මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**කොළඹ බේරුම්කරණ අංශය හා කාර්මික අධිකරණයේ දී ය.**

එම්. ජී. උජිතා රසාංගනී ඇතුලු සේවකයින් තිදෙනා
අංක 77, යුනිවර්සල් සිටි,
බටුවන්තුඩාව පාර,
හපුගල.

යොමු අංකය: IR/COM/03/2020/255

නඩු අංකය: A /76/2022

*පළමුවැනි පාර්ශවය*

පළමු පාර්ශවය වෙනුවෙන් නියෝජිත
ග්‍රේෂන් සිල්වා මහතා පෙනී සිටී.

සහ

දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය,
අංක 19, පහළ ඩික්සන් පාර,
ගාල්ල.

*දෙවන පාර්ශවය*

දෙවන පාර්ශවය වෙනුවෙන් වගඋත්තරකාර ආයතනය වෙනුවෙන්
පරිපාලන නිලධාරි චාමලි සිල්වා මහත්මිය පැමිණ සිටී. ඇ සමග නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥ චිරස්ති සෙනවිරත්න මහත්මිය පෙනී සිටී.

ප්‍රදානය

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර මැතිතුමා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37) දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවන පනත්වලින් සංශෝධනය වූ, ශ්‍රී ලංකා ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදයේ (1956 සංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරවුල් 4(1) වගන්තිය යටතේ කම්කරු අමාත්‍යතුමාට පැවරී ඇති බලතල ප්‍රකාරව උක්ත ආරවුල බේරුම් කිරීම සඳහා 2022.11.14 දිනැති නියෝගයෙන් බේරුම්කරුවකු වශයෙන් මා පත්කොට මා යොමු කර ඇත.

*ආරාවුලට හේතු වී ඇති කරුණු*

බේරුම්කරණය සඳහා මා වෙත යොමු කොට ඇති උක්ත නියෝග ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරවුලට හේතු වී පවත්නා කාරණය ලෙස කම්කරු කොමසාරිස් ජෙනරාල් විසින් 2022.11.10 එවා ඇති ලිපියේ දක්වෙන්නේ,

(1) 2005.12.31 දිනට පුරප්පාඩුව පැවති ලිපිකරු තනතුර හිමි ද හිමි නම් එය පළමුවැනි පාර්ශවයන්ට ලබා නොදීම සහ

(2) මෙම සේවකයින් තිදෙනාහට ලිපිකරු තනතුර සඳහා මූලික වැටුප ලෙස ඉල්ලුම් පත්‍රයේ හා පත්වීම් ලිපියේ සඳහන් රු. 14,280 ක් වන වැටුප වසර 13ක් ලබා දී 2019.07.15 දින සිට මූලික වැටුප රු. 13,320 ක් ලෙස අඩුකර ගෙවීමය.

*පෙනී සිටීම සහ බේරුම්කරණ විභාග පටිපාටිය*

මෙම පරීක්ෂණය 2022.12.05 දින මුල්වරට කැඳවන ලද දිනයේ සිට බේරුම්කරණ විභාගය අවසන් කරන ලද කාලය තුළ සෑම දිනකම දෙපාර්ශවයම පැමිණ සිටින ලදී. 2023.02.27 දකුණු පළාත් මාර්ග සංවර්ධන අධිකාරියේ පරිපාලන නිලධාරි ගිනිගේ තුෂාර ශ්‍යාමලී ද සිල්වා මහත්මිය පැමිණ සිටින ලදී.

(1) එම පාර්ශවයේ සාක්ෂිකරු වන එම්. ටී. ලක්මාල් සහ නීතිපති දෙපාර්තමේන්තුවේ නීතිඥතුමිය වන විරස්ති සෙනවිරත්න ද පැමිණියේ නැත. නීතිඥතුමිය මේ සම්බන්ධයෙන් මෝසමක් ද ඉදිරිපත් කර ඇත.

(2) 2022.12.23 දින දෙවන පාර්ශවයේ ලේඛන ඉදිරිපත් කිරීමෙන් ඉල්ලා සිටියේ මෙම ඉල්ලීම නිෂ්ප්‍රභා කරන ලෙසය. එහි දක්වා ඇති කරුණු සැලකිල්ලට ගෙන එම ඉල්ලීම ප්‍රතික්ෂේප කරන ලදී.

(3) පළමුවැනි පාර්ශවයේ සාක්ෂිකරු වන එම්. ජී. උජිතා රසාංගනී සාක්ෂි ලබා දී ඇත්තේ ඇය විසින් අවුරුදු 12ක පමණ කාලයක් ලැබූ වැටුප (අවුරුදු 12 මාස 07) අඩු කලා යැයි කියා සිටින්නේ ජූලි මාසයේ සිට බව 2019.07.15 දින සිට පවසමිනි.

(4) 2023.03.13 වැනි දින ගණකාධිකාරී එම්. ටී. ලක්මාල් මහතා ප්‍රතිඥා දෙමින් මෙසේ පවසයි. ඔබ අද දින ඉදිරිපත් කරනවා කියාපු A3 ලේඛනය පොරොන්දු වූ පරිදි එය අද ඉදිරිපත් කරන්නේ නෑ. දෙවැනි පාර්ශවයේ නීතිඥතුමිය අදාල ලේඛනය සෙවීමට ලක්කර ඇති බව තව ද ගිණුම් කාරක සභාවේ හා ආණ්ඩුකාරතුමා අත්සන් කරන ලද ලේඛනය ඉදිරිපත් කිරීමට අපොහොසත් විය. එම ලේඛනය සොයා ගැනීමට බැරි බව දන්වන ලදී.

(5) තවද සාක්ෂිකරු කියා සිටින්නේ කොයිම වාර්තාවක්වත් වැටුප් අඩු කිරීමට නිර්දේශ කර නොමැති බවයි.

(6) ආයතනයේ ඇති පුරප්පාඩු පිරවීමේ බලය ඇත්තේ පාලන මණ්ඩලයේ අභිමතය පරිදි පහත ශ්‍රේණිවල නිලයින්ගේ ඉල්ලීම මත නොවන අතර පළමු පාර්ශවයට අසාධාරණයක් මෙමගින් සිදුවී නොමැති බවත් ය.

(7) තවද මෙම පරීක්ෂණය අවසානයේ පෙනී යන්නේ ඉල්ලුම්කරුවන්ට හිමි අඩු කරන ලද වැටුප් සහ දීමනා සමග නිසි වැටුප් වර්ධක සමග කලින් ගෙවන ලද වැටුප් තලයේ පිහිටීමයි.

## ප්‍රදානය

ඉල්ලුම්කරුවන් තිදෙනා විසින් වෙන් වෙන්ව ඉල්ලා සිටින මුළු මුදල පහත සඳහන් පරිදි වේ.

(1) එම්. ජී. උජිතා රසාංගනී මිය - රුපියල් දෙලක්ෂ පනස් දහස් අටසිය හතලිස් තුනයි ශත අසූවයි. (250843.80)
(2) චන්ද්‍රිකා ජානකි ගුණතිලක මිය - දෙලක්ෂ එකොලොස්දහස් හත්සිය විසිහතයි ශත හයයි (211727.06)
(3) ඩී. ජී. ජයනීතා - දෙලක්ෂ නමදහස් හයසිය පනස් අටයි ශත අසූ හතයි (209658.87)

ඉල්ලුම්කරුවන් තිදෙනා ඉල්ලා සිටි මුදල් ප්‍රමාණයේ මුළු එකතුව රුපියල් හය ලක්ෂ හැත්තදෙදාහස් දෙසිය විසි නමයයි ශත හැත්තෑතුනක් පමණි. (672229.73)

(1) ඉහත සඳහන් මුදල හැර අමතර කිසිදු මුදලක් කිසිම පාර්ශවයකට හිමි නොවේ. තවද බේරුම්කරණයේ විභාගයට සම්බන්ධ ගාස්තු හෝ වෙනත් වියදමක් එක් පාර්ශවයකින් තවත් පාර්ශවයකට හිමි නොවේ.

(2) මෙම ප්‍රදානය අනුව ගෙවිය යුතු සම්පූර්ණ මුදල වන රුපියල් හය ලක්ෂ හැත්තෑදෙදාහස් දෙසිය විසි නමයයි ශත හැත්තෑතුනක් පමණි. (672229.73) මෙම මුදල ගාල්ල සහකාර කොමසාරිස් කාර්යාලයේ කොමසාරිස් නමින් තැන්පත් කරන ලෙසට මෙයින් නියෝග කරමි. මෙම ප්‍රදානය රජයේ *ගැසට් පත්‍රයේ* පළවූ දින සිට මසක් ඇතුළත තැන්පත් කළ යුතුය.

මෙය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බවට ප්‍රකාශ කරමි.

කපිතාන් එම්. ජී. ජී. මෙන්ඩිස්.
බේරුම්කරු.

2023 අප්‍රේල් දහහත්වන දින කාර්මික අධිකරණයේ දී ය.

යොමු අංකය - IR/COM/03/2020/255
නඩු අංකය - A/76/2022

**ලබා දිය යුතු හිඟ වැටුප් දීමනා සමග**
**චන්ද්‍රිකා ජානකී ගුණතිලක මිය**
**වර්ෂ 2019 ජූලි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලු දීමනා සහිත**
**ලබා දිය යුතු හිඟ වැටුප්**

| | | | |
|---|---|---|---|
| 2019 ජූලි මස සිට 2019 දෙසැම්බර් | රු.ශත | | |
| හිඟ වැටුප් | 4,726.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 378.08 | | |
| හිඟ සේ.අ.අ. 12% | 567.12 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 141.78 | | |
| හිඟ අතිකාල දීමනා | 2,959.50 | | |
| මුළු මුදල | | 8,394.40 | |
| 2020 ජනවාරි සිට 2020 දෙසැම්බර් | රු.ශත | | |
| හිඟ වැටුප් | 33,060.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 2,644.80 | | |
| හිඟ සේ.අ.අ. 12% | 3,967.20 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 991.80 | | |
| හිඟ අතිකාල දීමනා | 4,068.75 | | |
| මුළු මුදල | | 42,087.75 | |
| 2021 ජනවාරි සිට 2021 දෙසැම්බර් | රු.ශත | | |
| හිඟ වැටුප් | 58,800.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 4,704.00 | | |
| හිඟ සේ.අ.අ. 12% | 7,056.00 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 1,764.00 | | |
| හිඟ අතිකාල දීමනා | 4,540.77 | | |
| මුළු මුදල | | 72,160.77 | |
| 2022 ජනවාරි සිට 2022 දෙසැම්බර් | රු.ශත | | |
| හිඟ වැටුප් | 61,800.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 4,944.00 | | |
| හිඟ සේ.අ.අ. 12% | 7,416.00 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 1,854.00 | | |
| හිඟ අතිකාල දීමනා | 4,694.14 | | |
| මුළු මුදල | | 75,764.14 | |
| 2023 ජනවාරි සහ පෙබරවාරි මාස | රු.ශත | | |
| හිඟ වැටුප් | 10,800.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 864.00 | | |
| හිඟ සේ.අ.අ. 12% | 1,296.00 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 324.00 | | |
| හිඟ අතිකාල දීමනා | 900.00 | | |
| මුළු මුදල | | 13,320.00 | |
| සම්පූර්ණ හිඟ වැටුප් දීමනා සමග | | | 211,727.06 |

කපිතාන් එම්.ජී.ජී.මෙන්ඩිස්
බේරුම්කරු

යොමු අංකය - IR/COM/03/2020/255
නඩු අංකය - A/76/2022

<u>ලබා දිය යුතු හිඟ වැටුප් දීමනා සමග</u>
<u>ඩී.ජී.ජයනිකා මිය</u>
<u>වර්ෂ 2019 ජූලි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලු දීමනා සහිත</u>
<u>ලබා දිය යුතු හිඟ වැටුප්</u>

| | | | |
|---|---|---|---|
| 2019 ජූලි මස සිට2019 දෙසැම්බර් | රු.ශත | | |
| හිඟ වැටුප් | 4,726.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 378.08 | | |
| හිඟ සේ.අ.අ. 12% | 567.12 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 141.78 | | |
| හිඟ අතිකාල දීමනා | 3,304.77 | | |
| මුළු මුදල | | 8,739.67 | |
| 2020 ජනවාරි සිට 2020 දෙසැම්බර් | රු.ශත | | |
| හිඟ වැටුප් | 33,060.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 2,644.80 | | |
| හිඟ සේ.අ.අ. 12% | 3,967.20 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 991.80 | | |
| හිඟ අතිකාල දීමනා | 4,592.05 | | |
| මුළු මුදල | | 42,611.05 | |
| 2021 ජනවාරි සිට 2021 දෙසැම්බර් | රු.ශත | | |
| හිඟ වැටුප් | 58,800.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 4,704.00 | | |
| හිඟ සේ.අ.අ. 12% | 7,056.00 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 1,764.00 | | |
| හිඟ අතිකාල දීමනා | 2,848.12 | | |
| මුළු මුදල | | 70,468.12 | |
| 2022 ජනවාරි සිට 2022 දෙසැම්බර් | රු.ශත | | |
| හිඟ වැටුප් | 61,800.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 4,944.00 | | |
| හිඟ සේ.අ.අ. 12% | 7,416.00 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 1,854.00 | | |
| හිඟ අතිකාල දීමනා | 3,250.00 | | |
| මුළු මුදල | | 74,320.00 | |
| 2023 ජනවාරි සහ පෙබරවාරි මාස | රු.ශත | | |
| හිඟ වැටුප් | 10,800.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 864.00 | | |
| හිඟ සේ.අ.අ. 12% | 1,296.00 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 324.00 | | |
| හිඟ අතිකාල දීමනා | 1,100.03 | | |
| මුළු මුදල | | 13,520.03 | |
| සම්පූර්ණ හිඟ වැටුප් දීමනා සමග | | | 209,658.87 |
| **ලබාදිය යුතු සම්පූර්ණ හිඟ වැටුප් දීමනා සමග** | | | **672,229.73** |

කපිතාන් එම්.ජී.ජී.මෙන්ඩිස්
බේරුම්කරු

යොමු අංකය - IR/COM/03/2020/255
නඩු අංකය - A/76/2022

ලබා දිය යුතු හිඟ වැටුප් දීමනා සමග
එම්.ජී.උපීකා රසාංගනී මිය
වර්ෂ 2019 ජූලි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සියලු දීමනා සහිත
ලබා දිය යුතු හිඟ වැටුප්

| | | | |
|---|---|---|---|
| 2019 ජූලි මස සිට2019 දෙසැම්බර් | රු.ශත | | |
| හිඟ වැටුප් | 4,726.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 378.08 | | |
| හිඟ සේ.අ.අ. 12% | 567.12 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 141.78 | | |
| හිඟ අතිකාල දීමනා | 7,875.90 | | |
| මුළු මුදල | | 13,310.80 | |
| 2020 ජනවාරි සිට 2020 දෙසැම්බර් | රු.ශත | | |
| හිඟ වැටුප් | 33,060.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 2,644.80 | | |
| හිඟ සේ.අ.අ. 12% | 3,967.20 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 991.80 | | |
| හිඟ අතිකාල දීමනා | 10,505.00 | | |
| මුළු මුදල | | 48,524.00 | |
| 2021 ජනවාරි සිට 2021 දෙසැම්බර් | රු.ශත | | |
| හිඟ වැටුප් | 58,800.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 4,704.00 | | |
| හිඟ සේ.අ.අ. 12% | 7,056.00 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 1,764.00 | | |
| හිඟ අතිකාල දීමනා | 16,433.00 | | |
| මුළු මුදල | | 84,053.00 | |
| 2022 ජනවාරි සිට 2022 දෙසැම්බර් | රු.ශත | | |
| හිඟ වැටුප් | 61,800.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 4,944.00 | | |
| හිඟ සේ.අ.අ. 12% | 7,416.00 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 1,854.00 | | |
| හිඟ අතිකාල දීමනා | 18,766.00 | | |
| මුළු මුදල | | 89,836.00 | |
| 2023 ජනවාරි සහ පෙබරවාරි මාස | රු.ශත | | |
| හිඟ වැටුප් | 10,800.00 | | |
| හිඟ සේ.අ.අ. 8% | 864.00 | | |
| හිඟ සේ.අ.අ. 12% | 1,296.00 | | |
| හිඟ සේ.නි.භා.අ. 3% | 324.00 | | |
| හිඟ අතිකාල දීමනා | 2,700.00 | | |
| මුළු මුදල | | 15,120.00 | |
| සම්පූර්ණ හිඟ වැටුප් දීමනා සමග | | | 250,843.80 |

කපිතාන් එම්.ජී.ජී.මෙන්ඩිස්
බේරුම්කරු

EOG 06 - 0018

මගේ අංකය: IR/COM/02/2017/112.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.02.14 දිනැති හා අංක 2110/39 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.02.07 දින දරන නියෝගයෙන්, එක් පාර්ශවයක් වශයෙන් පොල්ගස්ඕවිට, සියඹලාගොඩ, 5 වන පටුමග, රණතිස්ස උයන, අංක 200ඒ 55 හි පදිංචි ඩබ්. ඒ. ධර්මදාස මයා සහ කොළඹ 05, නාරාහේන්පිට, කිරුළ පාර, අංක 200 හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2023.04.20 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2023 මැයි මස 23 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**බේරුම් කිරීමේ අංශය හා කාර්මික අධිකරණය**

නඩු අංකය: A /01/2019

යොමු අංකය: IR/COM/02/2017/112

ඩබ්. ඒ. ධර්මදාස,
අංක 200ඒ 55, රණතිස්ස උයන,
5 වන පටුමග, සියඹලාගොඩ,
පොල්ගස්ඕවිට.

*පළමුවැනි පාර්ශවය*

සහ

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*දෙවන පාර්ශවය*

*අතර කාර්මික ආරාවුල*

ප්‍රදානය

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මහතා විසින් වර්ෂ 1957 අංක 14 හා 1957 අංක 62 සහ 1962 අංක 4 සහ 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 සංශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව ඉහත නම් සඳහන් පාර්ශවයන් අතර වූ කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2019.02.07 වැනි දින බේරුම්කරුවකු වශයෙන් මා පත් කරන ලදී.

කම්කරු කොමසාරිස් ජනරාල් විසින් 2019.01.29 වැනි දින ගොනු කරන ලද අංක IR/COM/02/2017/112 දරන ලේඛනය අනුව ඉහත නම් සඳහන් පාර්ශවයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වන්නේ,

''ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවය කළ ඩබ්. ඒ. ධර්මදාස යන අය 2010.01.08 වැනි දින වේතන රහිතව වැඩ තහනම් කර කිසිදු පරීක්ෂණයකින් තොරව පෙර සිටි සේවා තත්ත්වයේ සේවය ප්‍රතිෂ්ඨාපනය කළ ද එම වැඩ තහනම් කළ කාලයට වේතන නොගෙවීම නිසා මෙම තැනැත්තාට යම් කිසි අසාධාරණයක් සිදු වී තිබේ ද? එසේ නම් ඔහුට ලැබිය යුතු සහන කවරේ ද යන්න වේ.''

දෙපාර්ශවය විසින් විස්තර ප්‍රකාශ ගොනු කිරීමෙන් පසු 2019.09.20 වැනි දින ඉල්ලුම්කරු වෙනුවෙන් ඔහුගේ නියෝජිත එම්. ජී. ඒ. මයිකල් මහතා ද දෙවන පාර්ශවය වෙනුවෙන් රජයේ නීතිඥ මල්මී අබේසුන්දර මහත්මිය ද පෙනී සිටිය දී මෙම කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීමට හැකියාවක් ඇත්දැයි විමසා බලන ලද අතර එසේ නිරවුල් කිරීමට හැකියාවක් නොතිබුණෙන් සාක්ෂි විමසීමට තීරණය කරන ලදි. ඒ අනුව එදින ඉල්ලුම්කරු සාක්ෂි දුන් අතර ඔහුගේ සාක්ෂියේ දී A1, A2, A2(a), A3, A4, A5, A5(a), A6, A7, A8, A9 හා A10 දී යන ලේඛන ද ලකුණු කරන ලදී.

2019.11.01 දින ඉල්ලුම්කරු වැඩිදුර සාක්ෂි සඳහා නියමිතව තිබූ අතර එදින 2 වන පාර්ශවය වෙනුවෙන් මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරමින් ඉල්ලුම්කරු 2017.01.13 වැනි දින විශ්‍රාම ගොස් ඇති බැවින් මෙම ආරාවුල බේරුම්කරණය කිරීමට හැකියාවක් නොමැති බවත් ඒ හේතුව මත ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිශ්ප්‍රභා කරන ලෙසත් ඉල්ලා සිටින ලදී. ඒ අවස්ථාවේ ඉල්ලුම්කරු වෙනුවෙන් ප්‍රකාශ කර සිටියේ බේරුම්කරණය හමුවේ විමසීමට ලක් වී තිබෙන්නේ ඉල්ලුම්කරු සේවයේ යෙදී සිටි අවධියේ සාධාරණ හේතුවක් නොමැතිව වසර 4කුත් මාස 9ක් කාලයක් වේතන රහිතව තහනම් කර තිබීම පිළිබඳ බවත් අවස්ථා ගණනාවක එම ආරාවුල විසඳා ගැනීමට උත්සාහ දරා එය අසාර්ථක වීමෙන් පසු කාර්මික අධිකරණය හමුවට පැමිණි බවය.

මූලික විරෝධතාවය පිළිබඳව ලිඛිත කරුණු ඉදිරිපත් කිරීමට දෙපාර්ශවයට අවස්ථාව ලබා දෙන ලදී. දෙපාර්ශවය විසින් ලිඛිතව ඉදිරිපත් කළ කරුණු සලකා බලා මූලික විරෝධතාවය පිළිබඳ මගේ නියෝගය 2020.07.24 දින ප්‍රකාශයට පත් කළෙමි. ඉල්ලුම්කරු මෙම ආරාවුල කම්කරු කොමසාරිස්වරයා වෙත ඉදිරිපත් කර ඇත්තේ 2017 වසරේ බවත් කම්කරු කොමසාරිස් (කාර්මික සබඳතා) ඉදිරියේ මෙම ආරාවුල පිළිබඳ විමර්ශනයක් පවත්වා ඇති අතර කම්කරු කොමසාරිස්වරයා සඳහන් කර ඇත්තේ ඉල්ලුම්කරු හා දෙවන පාර්ශවය අතර සේවා ගිවිසුම අඛණ්ඩව පැවති බවත් ඉල්ලුම්කරු වැඩ තහනමට ලක්ව සිටි කාලයට වැටුප් නොගෙවීමට දෙවන පාර්ශවය තීරණය කර ඇත්තේ ඒක පාර්ශවිකව බවත් ය.

කෙසේ වෙතත් මෙම ආරාවුල බේරුම්කරණයට යොමු කිරීම සුදුසු බව කම්කරු කොමාසාරිස්වරයා නිර්දේශ කර ඇත. ඉල්ලුම්කරුට අසාධාරණයක් සිදු වී ඇත් ද යන්න තීරණය කළ හැක්කේ සාක්ෂි විභාග කිරීමෙන් පසුව බව තීරණය කරමින් මා විසින් දෙවන පාර්ශවයේ මූලික විරෝධතාව නිශ්ප්‍රභා කරන ලදී. ඒ අනුව තව දුරටත් මෙම කාර්මික ආරාවුල පිළිබඳ සාක්ෂි විමසීමට තීරණය කළෙමි.

ඉල්ලුම්කරු සිය සාක්ෂියේ දී A6 ලෙස ලකුණු කරන ලද්දේ ඉල්ලුම්කරු 2007.11.12 දින සිට මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුවට මුදා හරින ලද ලිපියයි.

මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුවේ රියදුරු බලපත්‍ර නිකුත් කරන අංශයේ සේවය කරමින් සිටිය දී 2009.11.12 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව තමා අත්අඩංගුවට ගත් බව ඉල්ලුම්කරු ප්‍රකාශ කළේය. අනතුරුව කූට ලෙස සාදනු ලැබූ රියදුරු බලපත්‍ර තම ස්වාමිත්වයේ තබා ගැනීම සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කොටුව මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පැවරූ බව ප්‍රකාශ කළ ඉල්ලුම්කරු අංක 89555/11 දරන එම නඩුවට අදාළ ලේඛන සිය සාක්ෂියේ දී A2 ලෙස ලකුණු කරන ලදී. එම නඩුවේ දී ඉල්ලුම්කරුට එරෙහිව ඉදිරිපත් කළ චෝදනා A2(a) ලෙස ද වරද පිළිගත් බව සඳහන් කොටස A2(b) ලෙස ද ලකුණු කරන ලදී. අනතුරුව ඉල්ලුම්කරු නැවත ශ්‍රී ලංගමයට මුදා හරින ලද බව සඳහන් කළ ඉල්ලුම්කරු ඊට අදාළ ලිපිය A3 ලෙස ලකුණු කරන ලද අතර ශ්‍රී ලංගමය විසින් තමා වේතන රහිතව වැඩ තහනමකට ලක් කළ බවත් සඳහන් කළ ඉල්ලුම්කරු ඊට අදාළ ලිපිය A4 ලෙස ලකුණු කරන ලදී. ඉල්ලුම්කරු ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාවේ සඳහන් බරපතල විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති නිසා එසේ වැඩ තහනමකට ලක් කරන ලද බව එම ලිපියේ සඳහන් වන බව ඉල්ලුම්කරු සඳහන් කළේය. ඉල්ලුම්කරු තවදුරටත් සඳහන් කළේ එසේ වැඩ තහනමකට ලක් කිරීමට පෙර තමාගෙන් කිසිඳු ප්‍රකාශයක් ලබා නොගත් බවත්, චෝදනා පත්‍රයක් ලබා දී විනය පරීක්ෂණයක් නොපැවැත්වූ බවත් ය. ඉල්ලුම්කරු අවුරුදු 4යි මාස 8ක් පමණ රැකියාව නොමැතිව සිටි බවත් ඒ කාලය තුළ කීප වරක් තමන්ට නැවත රැකියාව ලබාදෙන ලෙස ඉල්ලා සිටි බව ප්‍රකාශ කළ ඉල්ලුම්කරු නැවත සේවයේ පිහිටුවීමට කරන ලද ඉල්ලීමට අදාළව ශ්‍රී ලංගම මානව සම්පත් කළමනාකරු 2012.09.13 දාතමින් ඉල්ලුම්කරුට එවන ලද ලිපියක් A6 ලෙස ලකුණු කරන ලදී. එසේම ඉල්ලුම්කරු සේවයේ ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා ආයාචනය නමින් 2014.09.09 දින ශ්‍රී ලංගම මානව සම්පත් කළමනාකරුට යවන ලද ලිපිය A7 ලෙස ලකුණු කරන ලදී. ඉල්ලුම්කරුගේ සාක්ෂියේ දී A8 ලෙස ලකුණු කරන ලද්දේ 2014.10.22 දාතමින් ඉල්ලුම්කරු සේවයේ ප්‍රතිෂ්ඨාපනය කිරීමට අදාළ ලිපියයි. ඉල්ලුම්කරු සේවයේ තහනම් කර සිටි කාලයට නොගෙවන ලද වේතනය ලබාගැනීම යන මැයෙන් ශ්‍රී ලංගම සභාපති වෙත යවන ලද ලිපියක් A9 ලෙස ද, පසු පඩි සඳහා අභියාචනය නමින් ශ්‍රී ලංගම ප්‍රධාන නීති නිලධාරීට යවන ලද ලිපියක් A9(a) ලෙස ද ලකුණු කරන ලද අතර සේවය නතර කර තිබූ කාලය සඳහා වැටුප් ලබාදෙන ලෙස ඉල්ලා කම්කරු ඇමතිතුමාට යවන ලද ලිපියක් A10 ලෙස ද ලකුණු කරන ලදී. ඉල්ලුම්කරු සිය සාක්ෂිය අවසානයේ දී ඉල්ලා සිටින ලද්දේ සේවය නතර කර තිබූ කාලය සඳහා වැටුප් ලබා නොදීමෙන් තමාට අසාධාරණයක් සිදු වූ බවත්, ඒ අනුව එම කාලය සඳහා වැටුප් ලබාදෙන ලෙසත් ය.

අනතුරුව දෙවන පාර්ශ්වය වෙනුවෙන් ඉල්ලුම්කරුගෙන් හරස් ප්‍රශ්න අසන ලදී. එම හරස් ප්‍රශ්න අසන අවස්ථාවේ දෙවන පාර්ශ්වය ඉල්ලුම්කරු මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුවට මුදා හරින ලද ලිපිය R1 ලෙස ද, මහෙස්ත්‍රාත් අධිකරණයේ පැවති නඩුවට අදාළ ලේඛන, R2, R2(a) හා R2(b) ලෙස ද මහෙස්ත්‍රාත් අධිකරණ නියෝගය R3 ලෙස ද ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කිරීමට අදාළ ලිපිය R5 ලෙස ද මහෙස්ත්‍රාත් අධිකරණ අංක 89555/11 නඩුවෙහි තවත් කාර්ය සටහනක් R6, R6(a) හා R6(b) ලෙස ද ඉල්ලුම්කරු සේවයේ ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ලිපිය R7 ලෙස ද ලකුණු කරන ලදී. ඒ අනුව දෙවන පාර්ශ්වයේ ස්ථාවරය වූයේ,

i. ඉල්ලුම්කරු මහෙස්ත්‍රාත් අධිකරණ නඩුවේ දී ඔහුට ඉදිරිපත් වූ චෝදනාවලට වරද පිළිගෙන ඇති බවත් ඔහු ශ්‍රී ලංගම ව්‍යවස්ථා මාලාවේ බරපතල විෂමාචාර ක්‍රියාවක් සිදු කර ඇති බවත්,

ii. ඉල්ලුම්කරු නැවත සේවයේ ප්‍රතිෂ්ඨාපනය කරන ලද්දේ යම් කොන්දේසිවලට යටත් කර බවත් ඉල්ලුම්කරු නැවත රැකියාව ලබාගෙන ඇත්තේ එම කොන්දේසිය පිළිගෙන බවත් ය.

ඉල්ලුම්කරු වෙනුවෙන් වෙනත් සාක්ෂි නොකැඳවන ලද අතර ඉල්ලුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුව ආශ්‍රයෙන් සාක්ෂි දීමට දෙවන පාර්ශ්වය වෙනුවෙන් විනය විභාග නිලධාරි ගයාන් චන්ද්‍රසිරි පෙරේරා සාක්ෂියට කැඳවන ලදී.

සාක්ෂි දුන් සාක්ෂිකරු ඉල්ලුම්කරුව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අත්අඩංගුවට ගත් බව දැක්වෙන ලේඛනය R9 ලෙසත් ඒ අනුව අත්අඩංගුවට ගත් දිනය R9(A) ලෙසත් ලකුණු කරන ලදී. ඉල්ලුම්කරුගේ සේවා තහනම් කිරීමේ ලිපිය R10 ලෙස ද ඉල්ලුම්කරුට එරෙහිව මහෙස්ත්‍රාත් අධිකරණය ගොනු කරන ලද චෝදනා පත්‍රය R11 ලෙස ද ඉල්ලුම්කරු තුන්වන චූදිත ලෙස දැක්වෙන කොටස R9(a) ලෙස ද ඉල්ලුම්කරු වරදකරු කළ බව දැක්වෙන කොටස R12 ලෙස ද ලකුණු කරන ලදී. සාක්ෂිකරු වැඩිදුරටත් සාක්ෂි දෙමින් සඳහන් කරන ලද්දේ ඉල්ලුම්කරු විසින් කරන ලද වරද ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාවේ A1 උපලේඛනයේ සඳහන් බරපතල විෂමාචාර ක්‍රියාවක් බවය. එකී විනය ව්‍යවස්ථා මාලාවේ A1 උපලේඛනය R13 ලෙසත් එහි 31 වන වගන්තිය R13(A) ලෙසත්

ලකුණු කරන ලදී. තව ද සාක්ෂිකරු ප්‍රකාශ කළේ අංක 2005 අංක 27 දරන පනතේ 15 වන වගන්තියේ දැක්වෙන ආකාරයට දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ කාර්ය සඳහා මණ්ඩලයේ සියලු නිලධාරීන් හා සේවකයන් රාජ්‍ය සේවකයින් ලෙස සලකන බවය. එම පනත R14 ලෙස ද එහි 15 වන වගන්තිය R14(A) ලෙස සලකුණු කරන ලදී. ඉල්ලුම්කරු සම්බන්ධයෙන් ශ්‍රී ලංගම විධිමත් පරීක්ෂණයක් නොපැවැත්වීමට හේතු විස්තර කරමින් සාක්ෂිකරු ප්‍රකාශ කළේ ඉල්ලුම්කරු පිළිබඳ පරීක්ෂණ පවත්වා ඇත්තේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව බවත් මහෙස්ත්‍රාත් අධිකරණය ඉදිරියේ වරදකරු ලෙස පිළිගෙන ඇති බවත් නැවත මණ්ඩලය පරීක්ෂණයක් පැවැත්වීමේ අවශ්‍යතාවයක් පැන නොනැගුන බවත් ය.

එම සාක්ෂියේ දී ඉල්ලුම්කරුගේ සේවය නැවත ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ලිපිය R15 ලෙස ලකුණු කරන ලදී. දෙවන පාර්ශ්වය වෙනුවෙන් වෙනත් සාක්ෂි නොකැඳවන ලදී.

සාක්ෂි විමසීම අවසන් වීමෙන් පසු, දෙපාර්ශ්වයටම ලිඛිත දේශන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබාදෙන ලද අතර ලිඛිත දේශන ද ඉදිරිපත් කිරීමෙන් පසුව මෙම කරුණු පිළිබඳ තීරණය කිරීම සඳහා දෙපාර්ශ්වයේ සාක්ෂි ද, ලේඛන ද, ලිඛිත දේශන ද සලකා බැලුවෙමි.

දෙපාර්ශ්වය අතර සජීවී කාර්මික ආරාවුලක් නොමැති බවට දෙවන පාර්ශ්වය සිය ලිඛිත දේශනයෙන් දීර්ඝ ලෙස කරුණු දක්වා ඇත. සජීවී ආරාවුලක් නොමැති බවට මෙම විමසීම ආරම්භ වූ අවස්ථාවේ දෙවන පාර්ශ්වය විසින් මතු කරන ලද මූලික විරෝධතාවය පිළිබඳ දෙපාර්ශ්වය විසින්ම ඉදිරිපත් කරන ලද කරුණු සලකා බලා එම මූලික විරෝධතාවය ප්‍රතික්ෂේප කළෙමි. එම නිසා නැවතත් දෙවන පාර්ශ්වය එම කරුණ පිළිබඳව සිය ලිඛිත දේශනයේ සඳහන් කර ඇති කරුණු කෙරේ අවධානය යොමු නොකළෙමි.

ඒ අනුව මා අවධානය යොමු කරන ලද්දේ මා වෙත යොමු කරන ලද කාර්මික ආරාවුල වූ ඉල්ලුම්කරු 2010.01.08 දින සිට වේතන රහිතව වැඩ තහනම් කර කිසිදු පරීක්ෂණයකින් තොරව 2014.10.22 දිනැතිව සේවා බණ්ඩනයකින් තොරව පෙර සිටි සේවා තත්ත්වයේ සේවය ප්‍රතිෂ්ඨාපනය කළ ද වැඩ තහනම් කාලයට වේතන නොගෙවීමෙන් යම් කිසි අසාධාරණයක් සිදුවී තිබේ ද යන්න පිළිබඳවයි.

ඉල්ලුම්කරු මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර සිටිය දී කරන ලද ක්‍රියාවක් සම්බන්ධයෙන් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව පරීක්ෂණයක් පවත්වා අත්අඩංගුවට ගත් බව, එම වරද සම්බන්ධයෙන් කොටුව මහෙස්ත්‍රාත් අධිකරණ හමුවේ ඉල්ලුම්කරුට එරෙහිව අංක 89555/11 දරන නඩුව පැවති බව ඉල්ලුම්කරු සිය සාක්ෂියේ දී පිළිගන්නා ලද අතර ඊට අදාළ ලේඛන කීපයක් ද ලකුණු කරන ලදී. දෙවන පාර්ශ්වය එම නඩුවලට අදාළ බී වාර්තා චෝදනා පත්‍රය මෙන්ම මහෙස්ත්‍රාත්වරයා 2012.07.04 දින ලබාදෙන ලද තීන්දුව (R3) ලකුණු කර ඉදිරිපත් කරන ලදී.

R3 ලෙස ලකුණු කරන ලද ලේඛනය කෙරේ අවධානය යොමු කළෙමි. එහි මෙසේ සඳහන් වේ.
2012.07.04

වූ/ඩබ්. ඒ. ඒ. ඩී. ධර්මදාස සිටී.
හඳුනා ගැනීම දඬුවම් (වාර්තා ලැබී ඇත.)

චූදිතට පෙර වැරදි නොමැති බව හා වරද පිළිගැනීම සලකා බලා චූදිත චෝදනාවලට වරදකරු නොකරමි. අ.න.වි.සං. 306 වගන්තිය අනුව වසර 4ක් සඳහා මෙවැනි වැරදිවලට යොමු නොවන කොන්දේසිය මත පමණක් ලබාදෙමි යනුවෙන් සඳහන් වේ. ඉල්ලුම්කරු එරෙහිව ඉදිරිපත් කරන ලද චෝදනාව වූයේ කූට ලෙස සාදනු ලැබූ රියදුරු බලපත්‍ර තම ස්වාමිත්වයේ තබා ගැනීමය.

එම චෝදනාවලට ඉල්ලුම්කරු වරද පිළිගන්නා ලද බව එම ලේඛනයෙන් තහවුරු වේ. ඉල්ලුම්කරු සිය සාක්ෂියේ දී ඒ බව පිළිගත්තේය. එම සිද්ධියෙන් පසු ඉල්ලුම්කරු මෝටර් රථ කොමසාරිස් දෙපාර්තමේන්තුවේ සිට ශ්‍රී ලංගම වෙත නැවත අනුයුක්ත කිරීමෙන් පසු 2010.01.08 දින සිට වැඩ තහනමකට ලක් කර ඇත. දෙවන පාර්ශ්වය ප්‍රකාශ කර සිටියේ ශ්‍රී ලංගම විනය ව්‍යවස්ථාව

අනුව ඉල්ලුම්කරු බරපතල විෂමාචාර ක්‍රියාවක් සිදුකර ඇති බවයි. කෙසේ වුවද ඉල්ලුම්කරු විසින් පාලන අධිකාරියට කරන ලද ඉල්ලීමක් සලකා බලා ඔහුගේ සේවය නැවත ප්‍රතිෂ්ඨාපනය කර තිබේ. R7 ලෙස දෙවන පාර්ශ්වය විසින් ලකුණු කරන ලද සේවය ප්‍රතිෂ්ඨාපනය කිරීමට අදාළ ලිපියේ මෙසේ සඳහන් වේ. ''ඉහත සඳහන් නඩුව සම්බන්ධව දෙන ලද චූදිතට පෙර වැරදි නොමැති බව හා වරද පිළිගැනීම සලකා බලා චූදිත චෝදනාවලට වැරදිකරු නොකරමි.'' යන නියෝගය අනුව ඔබ විසින් කරන ලද ඉල්ලීම සලකා බලා ශ්‍රී ලංගම ඉහළ කළමනාකාරිත්වය ලබා දුන් අනුමැතිය අනුව හා ශ්‍රී ලංගම සේවකයින් විශ්‍රාම ගැන්වීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2013 අංක 3 දරන ශ්‍රී ලංගම මානව සම්පත් කළමනාකරණ කොට්ඨාස චක්‍ර ලේඛනයේ විධි විධාන සැලකිල්ලට ගෙන ඔබට වයස අවු. 57 2014.01.15 වැනි දිනට සම්පූර්ණ වන බැවින් 2014.01.14 වැනි දින දක්වා කාලය පසු වැටුප් රහිතව සේවා බණ්ඩනයකින් තොරව පෙර සිටි සේවා තත්ත්වයේම මාගේ අංක ශ්‍රී ලංගම/විනය/04/2010 සමාංක රැගත් ලිපියෙන් ඔබගේ සේවය තහනම් කළ 2010.01.08 දින හෝ ඊට ආසන්න දිනක සිට සේවය ප්‍රතිෂ්ඨාපනය කරමි.''

එම ලිපියේ පැහැදිලිවම සඳහන් වන්නේ ''පසු වැටුප් රහිතව සේවා බණ්ඩනයකින් තොරව පෙර සිටි සේවා තත්ත්වයේම'' නැවත සේවය ප්‍රතිෂ්ඨාපනය කරන බවය.

ඉල්ලුම්කරු නැවත සේවයට පැමිණ ඇත්තේ එම ලිපියේ සඳහන් කොන්දේසි පිළිගනිමිනි. දෙවන පාර්ශ්වයේ ස්ථාවරය වන්නේ එහි සඳහන් කොන්දේසි පිළිගනිමින් සේවයට පැමිණි ඉල්ලුම්කරුට පසු වැටුප් ඉල්ලා සිටීමට නොහැකි බවයි. එසේ පසු වැටුප් ඉල්ලා සිටීම මගින් ප්‍රති බන්ධනය (Estoppel) වන බවයි. ඉහත සඳහන් කරුණු සලකා බලා ඉල්ලුම්කරු පසු වැටුප් ඉල්ලා සිටීමට අයිතියක් නොමැති බව තීරණය කරමි.

ඉල්ලුම්කරු වෙනුවෙන් මතු කරන ලද තවත් කරුණක් වන්නේ ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කිරීමෙන් පසු ශ්‍රී ලංගමය ඔහුගෙන් කට උත්තරයක් ලබා නොගත් බව හා ඔහුට එරෙහිව විනය පරීක්ෂණයක් නොපැවැත්වූ බවයි. එම කරුණු සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වයේ ස්ථාවරය වූයේ ඉල්ලුම්කරු වරද පිළිගෙන තිබීම, මණ්ඩලය තුළින් සිදු කරන විමර්ශනයට වඩා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව කළ විමර්ශනය ඉහළ තලයක විමර්ශනයක් වීම ආදී හේතුන් නිසා මණ්ඩලය මගින් නැවත පරීක්ෂණයක් සිදු නොකිරීමේ අවශ්‍යතාවයක් පැන නොනැගුන බවයි.

ඉහතින් සඳහන් කර ඇති කරුණු සලකා බලන විට පෙනී යන්නේ දෙවන පාර්ශ්වය ඉල්ලුම්කරු සම්බන්ධයෙන් සාධාරණ අයුරින් කටයුතු කර ඇති බවය. ඒ අනුව ඉල්ලුම්කරුගේ වැඩ තහනම් කර ඇති කාලයට වේතන නොගෙවීමෙන් ඔහුට අසාධාරණයක් සිදු වී නොමැති බව තීරණය කරමින් ඉල්ලුම්කරුගේ ඉල්ලීම නිෂ්ප්‍රභා කරමි. මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බව ද ප්‍රකාශ කරමි.

බේරුම්කරු,
නීතිඥ සරත් ලියනගේ.

2023 අප්‍රේල් මස 20 වැනි දින.

EOG 06 - 0019